***2016.05.31 වන දින අරලියගහ මන්දිරයේ පැවැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මහජන අදහස් විමසුම් කමිටු වාර්තාව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත පිළිගැන්වූ අවස්ථාවේදී දැක්වූ අදහස්.***

**නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ සාමාජිකයන් ඔවුන්ගේ වාර්තාව බාරදී තිබෙනවා. පළමුවෙන්ම කමිටු සභාපති ලාල් විජේනායක මහතා ඇතුළු සාමාජිකයන්ට ස්තුතිය පළ කළ යුතුයි.**

**මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජාතික ආණ්ඩුව වැඩකටයුතු කරන්නේ ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ඇති කිරීම සඳහා හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහායි. ඒ සඳහා අපට ශක්තිමත් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරගත යුතුයි. අපගේ ව්‍යායාමයට පාර්ලිමේන්තුවේ සහයෝගය ලැබී තිබෙනවා. පාර්ලිමේන්තුවේ පක්ෂ සියල්ලම එකතු වී ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීමට තීරණය කර තිබෙනවා. එම වැඩකටයුත්තේදී අප පළමුවෙන්ම සිදු කළේ මහජන අදහස් ලබා ගැනීමයි. එලෙස මහජන අදහස් ලබා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව මහජන අදහස් ලබා ගැනීමේ කමිටුවක් පත් කළා. මෙම කමිටුව රට වටේ ගොස් ලබාගත් ජනතා අදහස් අද අපට ඉදිරිපත් කර තිබෙනවා.**

**මීට පෙර 1972 ජනරජ ව්‍යවස්ථාව ඇති කිරීම සඳහා 1970 වසරේ තීරණය කළ පසුවත්, 1977 වසරේ දෙවන ජනරජ ව්‍යවස්ථාව ඇති කරන්නට තීරණය කළ පසුවත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක සමයේ ව්‍යවස්ථාවක් ගෙන ඒමට තීරණය කළ අවස්ථාවේදීත් පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභා විසින් ජනතා අදහස් ලබා ගත්තා. තේරීම් කාරක සභා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වුණා.**

**නමුත් මෙම අවස්ථාවේදී පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වෙනුවෙන් ජනතාව අතරින්ම ජනතා අදහස් ලබා ගැනීමට, අප කමිටුවක් පත් කළා. මෙරට සිවිල් ක්ෂේත්‍රවල නොයෙක් අංශවලට අයත් ව්‍යවස්ථාව පිළිබඳව, නීතිය පිළිබඳව, දේශපාලන විද්‍යාව සංහිඳියාව ඇති කිරීම පිළිබඳ පරිපාලනය පිළිබඳ, දක්ෂකමක් තිබෙන කණ්ඩායමකට ජනතා අදහස් ලබා ගෙන වාර්තාවක් සැකසීමේ වගකීම අප විසින් පැවරුවා. දැන් එම වාර්තාව ලැබී තිබෙනවා.**

**පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසින් තේරීම් කාරක සභාවක් පත් කර තිබෙනවා. තේරීම් කාරක සභාව යටතේ එක් එක් විෂයන් අනුව අනුකමිටු කීපයක් පත් කර තිබෙනවා. ලබන සතියේ සිට එම අනු කමිටුවල වැඩ කටයුතු ඇරැඹීමට කටයුතු කරනවා. ඔවුන්ගේ වැඩකටයුතුවලට සහය ලබා ගැනීම සඳහා මෙම වාර්තාව ඔවුන්ට ලබාදීමට අප කටයුතු කරනවා. වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව අනු කමිටුවලට තම අංශවලට අයත් කරුණු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළ හැකියි. එම අනු කමිටුවලට මෙම වාර්තාවේ ඇති යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීමට මේ වාර්තාව සකස් කළ සාමාජිකයන්ද කැඳවිය හැකියි.**

ඊට අමතරව අප නව ව්‍යවස්ථාව පිළිබඳව සියලුම දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කරනවා. වාර්තාවට අදහස් ඇතුළත් නොවූ අයගෙන්ද අප ලිඛිතව අදහස් විමසා තිබෙනවා. මහජන අදහස් විමසීමේ කමිටු සාමාජිකයන් සමග එම අදහස් සාකච්ඡා කර අවශ්‍ය නම් වැඩිදුර අදහස් ලබා ගැනීමට ඔවුන් කැදවීමට නියමිතයි.

ජූලි මාසයේ අවසානය වන විට එම වාර්තා ලබා ගැනීමට අප අදහස් කරනවා. ඒ අයුරින් අප ඉදිරියට යාමට සැලසුම් කර තිබෙනවා. පක්ෂ නායකයින් සමග මෙම කරුණු පිළිබඳව අප සාකච්ඡා කරමින් සිටිනවා.

මහජන අදහස් ලබා ගැනීමේ කමිටුව ලංකාව වටේ ගොස් ජනතාව මුණගැසුණා. ඔවුන්ගේ අදහස් ලබා ගත්තා. ඔවුන් සැකසූ වාර්තාව අනුව නව ව්‍යවස්ථාවක් සැකසීමේ කාර්යභාරය ඉදිරියට ගෙන යනවා. මෙම කමිටු සාමාජිකයන්ට අනු කමිටු සඳහාද අනෙක් වැඩකටයුතු සඳහාත් සම්බන්ධවීමට අවස්ථාව සලසනවා.

මට බාරදුන් වාර්තාව මෙහෙයුම් කාරක සභාවටත්, සෙසු අනුකමිටු වලටත් ලබා දීමට කටයුතු කරනවා යැයි රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේය.